**බියගම ප්‍රාදේශීය සභාවේ - 2021**

-----------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-------------

**1.1. තත්ත්වාගණනය කළ මතය**

----------------------------

බියගම ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බියගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

-----------------------------------------------------------------------------

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

----------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් ගෙවා තිබුණ ව්‍යාපෘති 03 කට අදාළව, වටිනාකම රු.3,590,492 ක්, මූල්‍ය ප්‍රකාශනයෙහි කර්මාන්ත ණයගැතියන් සහ ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි . | 2022 දෙසැම්බර් 31 ගිණුමෙන් එය නිවැරදි කරමි. | ගිණුම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘති දෙකකට අදාලව සභාවට ලැබී තිබුණු රු.64,735 ක් මූල්‍ය ප්‍රකාශනයෙහි කර්මාන්ත ණයගැති ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඇ) | මාකොළ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම අදියර II ව්‍යාපෘතියට අදාලව ගම්පහ පළාත් පාලන සහකාර කොමසාරිස් වෙතින් ලැබී, තිබුණු රු.1,913,136 ක් මූල්‍ය ප්‍රකාශනයෙහි කර්මාන්ත ණයගැති ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඈ) | ඕ. කේ. අයි. ජාත්‍යන්තර පාසල ඉදිරිපිට ඇති පොදු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සියයට 10 ක රඳවා ගැනීම් මුදල වන රු.99,865 හැර ඉතිරි මුදල ගෙවා තිබුණද, මූල්‍ය ප්‍රකාශනයෙහි මුළු මුදල වන රු.899,865 ක් දැක්වීම හේතුවෙන්, ණය ගැති හා ණය හිමි වටිනාකම රු.800,000 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 දෙසැම්බර් 31 ගිණුමෙන් එය නිවැරදි කරමි | සාවද්‍ය ලෙස බැර සහ හර කරන ලද ගිණුම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |
| (ඉ) | පරිගණක හා උපාංග යටතේ වර්ග කළයුතු රු.2,222,100 ක වටිනාකමින් යුත් මුද්‍රණ යන්ත්‍ර 27 ක් යන්ත්‍ර හා උපකරණ යටතේ සටහන්කර තිබීණි. තවද මේ අනුව පරිගණක හා උපාංග ක්ෂය රු.333,315 ක් අඩුවෙන් ගණනය කර තිබීම හේතුවෙන් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය සහ පරිගණක උපාංග ශේෂය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම් හඳුනා ගැනීමේදී, අතිරික්තයේ /ඌනතාවයේ හඳුනා ගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වන රු.11,037,333 අඩු කර දැක්විය යුතු වුවත්, එම වටිනාකම එකතුකර දක්වා තිබීම හේතුවෙන් වසර සඳහා විස්තීර්ණ ආදායම රු.22,074,666 කින් වැඩියෙන් ආදායම් ප්‍රකාශයේ මුහුනතෙහි දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වාදී ඇති පරිදි විස්තීරණ ආදායම, 2022.12.31 අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | විස්තීර්ණ ආදායම නිවැරදිව ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | යතුරුපැදි 4 ක් හා ත්‍රී රෝද රථ 4 ක් මිලදී ගැනීම සඳහා, රු.5,000,000 ක් 2019 වර්ෂයේදී ණය හිමියන් ලෙස වෙන්කර 2021 මූල්‍ය ප්‍රකාශනවල ද දක්වා තිබුණද, 2022 මාර්තු 10 දින වන විටත් එම වාහන මිලදීගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.5,000,000 කින් දේපළ පිරියත හා උපකරණ ශේෂය හා ණය හිමි ශේෂය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතියට යවා අනුමැතිය ලැබේ යැයි අපේක්ෂාවෙන් 2021 වර්ෂයේ ණයහිමි වෙන් කිරීම් වලට ඇතුලත් කර ඇත. 2022 වර්ෂය අවසන් වනවිටත්, අනුමැතිය නොලදහොත් 2023 මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. | 2022 වර්ෂයේ අනුමැතිය ලබාගෙන මිලදී ගැනීමට හෝ 2022 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී දේපල පිරියත හා උපකරණ හා ණයහිමි ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළයුතුය. |
| (ඌ) | 2019 සහ 2021 වර්ෂවලදී ලී බඩු , යන්ත්‍ර, පරිඝනක, කාර්යාල උපකරණ මිලදීගැනීම සඳහා එකතුව රු.34,313,879 ක් ණය හිමියෝ යටතේ දක්වා ඇතත්, 2022 ජුනි 15 දින වන විටත් එම උපකරණ මිලදීගෙන නොතිබුණු අතර, ණය හිමියා කවරෙක්ද යන්න හඳුනාගෙන ද නොතිබුණි. මේ හේතුවෙන් රු.34,313,879 කින් ජංගම නොවන වත්කම් ශේෂය හා ණය හිමි ශේෂය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | අයවැය චක්‍රලේඛ 03/2022 අනුව මිළදී ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇතත්, ගම්පහ ප.පා.ස.කොමසරිස්ගේ අනුමැතිය ලද පසු මිළදී ගැනීමට **කටයුතු කරමි.** | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.6.2. ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත හා වෙනත් ණය හිමි ශේෂය රු.394,332,270 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණය අනුව ගෙවීම් හිඟ හිටි කාලය වසර 1 ත් 2 ත් අතර ණය හිමි ශේෂය රු.50,355,267 ක් සහ වසර 02 ට වැඩි ශේෂය රු.9,870,114 ක්, ගෙවීමට කටයුතු කර නොතිබුණි. | පරික්ෂා කර බලා ගෙවීම් කිරීමට කටයුතු කරමි. | ණය හිමි ශේෂ පරික්ෂා කර ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ණයගැති කාල විශ්ලේෂණය අනුව ශේෂය රු.290,315,452 ක් වූ අතර, අයවීම් හිඟ හිටි කාලය වසර 1 ත් 2 ත් අතර ශේෂය රු.2,222,761 ක් සහ වසර 2 ට වැඩි ශේෂය රු.11,603,960 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි | ණය ගැති ශේෂ පරික්ෂා කර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6.3. නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 2 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. 115,300,309ක් හා අනුරූපී වාර්තා අනුව ශේෂය රු. 114,993,169 ක් වූයෙන් රු. 307,140 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කරමි. | ගිණුම් වාර්තා ඊට අදාල ලේඛන හා උප ලේඛන සමග සසදා නිවැරදි ශේෂ පවත්වා ගත යුතුය. |

## 1.7. අනුකූල නොවීම්

### නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1946 අංක 30 දරන බදු හා තක්සේරුකරන පනත | | | |
| වගන්ති අංක 20 | වසර 05 කට වරක් වරිපනම් තක්සේරු කළයුතු වුවත් දෙල්ගොඩ උප කාර්යාලයේ 2008 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙනද, මාකොළ හා කඩවත උප | හැකි ඉක්මනින් තක්සේරුවක් කිරීමට කටයුතු කරන බව තක්සේරු | නැවත සිහි කැඳවීම් යවා, තක්සේරුව කරවාගෙන, නව වරිපනම් රේට අනුව වරිපනම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| කාර්යාලවල 2012 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙනද, වරිපනම් අයකරගෙන තිබුණි. | දෙපාර්තමේන්තු වෙන් වාචිකව දැනුම්දී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.128,555,443 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.130,566,894 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

---------------------

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට වරිපනම්, වෙළඳ ස්ථාන කුලී සහ බදුකර කුලී ආදායම් කාල විශ්ලේෂණය අනුව වසර 1 ත් 3 ත් අතර, වසර 3 ත් 5ත් අතර, වසර 5 ත් 10 ත් අතර සහ වසර 10 ට වැඩි වටිනාකම පිළිවෙලින් රු.5,896,652 රු.16,052,998, රු.14,041,039 ක් සහ රු.23,567,892 ක් බවත් ආදායම් අයකිරීමේ ප්‍රගතිය පිළිවෙලින් බිල් කළ ආදායමෙන් සියයට 50, 19 හා 51 ක් බවත්, මේ අනුව ආදායම් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බවත් නිරීක්ෂණය විය. | 2021 වර්ෂය තුල නැවත පැතිරුණු Covid 19 වසංගත තත්ත්වය හා වර්තමානයේ දිවයින පුරා පවතින ආර්ථික පසුබෑම හමුවේ වරිපනම් බදු ඇතුළු අනිකුත් ආදායම් එකතු කර ගැනීම අපේක්ෂිත මට්ටමට සිදු කර ගත නොහැකි විය. වරෙන්තු නිකුත් කිරීමත්, ජංගම සේවා පැවැත්වීමත්, ගෙන් ගෙට ගොස් හිඟ බදු මුදල් එකතු කිරීමත්, ආදී කටයුතු මේ වන විට ආරම්භ කර ඇත | ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින්, 2020 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද ඉඩම් පිළිබඳ සමීක්ෂණයෙන් හඳුනා ගන්නා ලද ඉඩම් 92 න්, ඉඩම්වල විශාලත්වය අක්කර 2.36 ක් වූ ඉඩම් 07 ක් හා විශාලත්වය හඳුනා නොගත් ඉඩම් 07 ක් අගය කර, ඉඩම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | විගණනය මගින් පෙන්වා දී ඇති පරිදි, ගිණුමට ඇතුලත් නොවූ දේපල, ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉඩම් අගය කර, මූල්‍ය ප්‍රකාශනයේ දැක්විය යුතුය. |

**3.2. නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගලි බවුසරයක සේවාව සඳහා ඇති ඉල්ලුම සලකා බලා මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ යෝජනාවකට අනුව, ලීටර් 3600 ක ගලි බවුසරයක් මිලදී ගැනීමට 2017 වර්ෂයේදී රු.1,100,871 ක් වැයකර තිබුණි. මෙම ගලි බවුසරයෙන් 2019 වර්ෂයේ දී පමණක් රු.120,000 ක් ආදායමක් ලැබී තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වනවිට, මෙම ගලිබවුසරයට සවිකර භාවිතා කිරීමට අතිරේක ට්‍රැක්ටරයක් නොමැති වීම, අපද්‍රව්‍ය බැහැර ස්ථානය සඳහා යාමට වැඩි කාලයක් සහ වියදමක් දැරීමට සිදුවීම, ට්‍රැක්ටරයක් සවිකර භාවිතා කළයුතු නිසා ගතවන කාලය වැඩිවීම නිසා ඉල්ලුම අඩුවීම සහ බවුසරයේ නඩත්තු වියදම් හා ආදායම සැලකීමේදී ආදායම සීමිත වීම යනාදී කරුණු නිසා නිෂ්ක්‍රිය වත්කමක් බවට පත් වී තිබුණි. | බියගම ප්‍රාදේශීය සභාව මගින් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු මගින් ලබාගත් පිරිවිතරයන් මෙම ගලි බවුසරය මිළදී ගෙන ඇත. මේ සම්බන්ධයෙන් සොයා බලා මෙම ගලි බවුසරය නැවත භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. | ගලි බවුසරය මගින් ආදායම් උත්පාදනයට කටයුතු කළ යුතුය. |

**3.3. වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ සමීක්ෂණ වාර්තාවලට අනුව, හඳුනාගෙන ඇති සුසාන භූමි 18 ක සහ පොදු ඉඩම් 92 ක 2022 ජුනි 15 දින වනවිටත් ඉඩම් මැන, මායිම් හඳුනාගෙන , නාම පුවරු සවිකර නොතිබුණි. | COVID 19 වසංගත තත්වය හා ඉඩම්වලට අදාලව පැරණි ලේඛන සොයා ගැනීම දුෂ්කරවීම නිසා වැඩි කාලයක් ගතවීමට ඉඩ ඇති වුවත් හැකි ඉක්මනින් ඉතිරි සුසානභූමිද මැණුම් කර අවසන් කරන බව දන්වමි. මේ වන විට සුසාන භූමිවල නාමපුවරු සවි කිරීම සිදුකරමින් පවතී . | සුසාන භූමි මිනුම් කරවාගෙන නාමපුවරු සවි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට සභාව විසින් කරන ලද ඉඩම් පිළිබඳ සමීක්ෂණ වාර්තාව අනුව පර්චස් 37 ක් වූ වල්ගම, බණ්ඩාරදෙණිය ඉඩමේ කැලි කසල බැහැරකර ඇති බවද , ප්‍රමාණය හඳුනා ගත නොහැකි වල්ගම රාත්‍රි පොළ සහ වල්ගම, මල්වාන ඉඩම අනවසරයෙන් අත්පත්කරගෙන ඇති බවද, දෙල්ගොඩ නිවාස යෝජනා ක්‍රමය සහිත ඉඩමේ නිවාස 03 ක අනවසර පදිංචිකරුවන් සිටින බවද, හඳුනාගෙන ඇති නමුත්, සභාව එම අනවසර පරිහරණයන් ඉවත් කිරීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | පවුල් 05 ක් පදිංචිව සිටින දෙල්ගොඩ මීගහලන්ද නැමැති ඉඩමේ අයිතිය සනාථ කිරීම සඳහා සභාව සතුව නීතිමය ලියවිලි නොමැති අතර අදාල ඉඩම ආයෝජන මණ්ඩලය විසින් කුලී මත පවරා ඇති පරිත්‍යාගයක් බව පමණක් සඳහන් ලියවිල්ලක් සභාව සතුව පවතී. | සභාව සතු ඉඩම් සමීක්ෂණය කර අනවසර පදිංචිකරුවන් ඉවත් කලයුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු හෙක්ටයාර් 0.2886 ක්වූ ප්‍රමාණයේ ඉඩමේ, 2002 වර්ෂයේ දී ඉදිකිරීම් ආරම්භ කර, වසර 15ක් පුරා අතහැර දමා තිබුණු ගොඩනැගිල්ල, බහුකාර්යය ගොඩනැගිල්ලක් ලෙස සංවර්ධනය කිරීම සඳහා, වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ප්‍රාදේශීය සභා අරමුදලින් රු.මිලියන 24.47 ක් හා 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පළාත් සභා අරමුදලින් රු.මිලියන 16.9 ක් ඇතුළුව එකතුව රු.මිලියන 41.37 ක මුදලක් වැය කර තිබුණි. එම ඉඩම සභාවට පවරා දීමට 2022 මැයි 23 දිනැති | පවරා ගැනීමේ ඉදිරි කටයුතු කඩිනම් කිරීමට කටයුතු කරමි. | ඉඩම සභාවට නීත්‍යානුකූලව පවරා ගෙන, ගොඩනැගිල්ල භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. |

ලිපියෙන් ජනාධිපතිවරයාගේ එකඟතාවය ලැබී තිබුණද 2022 ජුනි 15 වන විටත් පවරාගෙන නොතිබුණි.

## 3.4. මානව සම්පත් කළමනාකරණය

--------------------------------

සේවක ණය

--------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවෙන් සේවය අත්හිටුවන ලද එක් නිලධාරියෙකුගෙන් රු.31,802 ක්ද, සේවය අතහැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු.694,480 ක් ද, මියගිය නිලධාරීන් 02 දෙනෙකුගෙන් රු.252,700 ක්ද, විශ්‍රාම ගිය එක් නිලධාරියකුගේ රු.368,730 ක් ද ලෙස එකතු වටිනාකම රු.1,347,712 ක් වූ සේවක ණය අත්තිකාරම් අයවීම් හිඟ හිටව පැවතුණි. | සේවය අත්හිටුවන ලද නිළධාරියෙකුගෙන් රු.31,802 ක මුදල අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. රු.368,730 ක මුදල පාරිතෝෂිතයෙන් අය කිරීමට කටයුතු කරමි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කලයුතුය . |